මගේ අංකය: ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු 2026

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්) වාර්ෂික ස්ථානමාරු අභියාචනා - 2026**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන හා 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය ප්‍රකාරව **2026.03.16** දින සිට ක්‍රියාත්මක වන පරිදි උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ සේවයේ (අධිකරණ ලඝු ලේඛක හැර) සහ සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර, සංවර්ධන නිලධාරී) නිලධාරීන් සඳහා ලබාදී ඇති ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව සලකා බැලීමෙන් පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙයට අමුණා ඇති ඇමුණුම - A (Annexure - A) ලේඛනයේ සඳහන් තීරණයන්ට එළඹ ඇත.

02. අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි ස්ථාන මාරුවීම් අත්හිටුවා ඇති නිලධාරීන් සහ වෙනත් සේවා ස්ථානවලට අනුයුක්ත කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. (මෙහිදී ලබා දී ඇති කාලපරිච්ඡේදය තුළ නඩු භාණ්ඩ භාරදීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර නැවත දීර්ඝ කිරීම සඳහා සිදු කරනු ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.)

03. ස්ථාන මාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදා හැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.
- අඩවැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.
- අඩවැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
- ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථාන මාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් පසුවය.

04. දැනට ප්‍රසූත නිවාඩු ලැබ සිටීම හේතුවෙන් ඉහත 03හි පරිදි කටයුතු කිරීමෙන් පසු නියමිත දින ස්ථාන මාරු නියෝග ලද සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීම සඳහා <u>වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට නොහැකි වන අවස්ථාවන්හිදී එලෙස මුදා හැරීමට නොහැකි නිලධාරීන් කවුරුන්ද යන්න</u> ස්ථාන මාරු ලද සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියාට පිටපතක් සහිතව මා වෙත දැන්වීමට කටයුතු කළ යුතුය.

05. 2026 වාර්ෂික ස්ථාන මාරු මඟින් ඉල්ලුම් කරන ලද සේවා ස්ථානයක්ම ලබා දීමට හෝ ඉල්ලුම් කරන ලද සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේම එක් අධිකරණයක් ලබා දීමට කටයුතු කර ඇති අවස්ථාවක දී හැර අනෙකුත් අභියාචනා (අධිකරණ රෙජිස්ට්‍රාර්, අධිකරණ යතුරු ලේඛක වැනි නිලධාරීන්ගේ) ඉල්ලීම් අනුප්‍රාප්තිකයින් නොමැතිවීම නිසා ඉටු කර නොමැති අවස්ථාවල එම ඉල්ලීම් අනුප්‍රාප්තිකයන් ලද විගස හෝ නව බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේදී ඉටු කිරීමට සටහන් කරගෙන ඇත. **නිලධාරීන්ගේ දුෂ්කරතාවයන් සහ සේවා අවශ්‍යතාවයන් පිළිබඳව විනිශ්චයකාරවරුන් විසින් කරන ලද ඉල්ලීම් ද සලකා බලා ඇතැම් විට අනුප්‍රාප්තිකයන්** රහිතව ස්ථාන මාරුවීම් ලබා දී ඇති අවස්ථාවල එමඟින් ඇතිවන පුරප්පාඩු නව බඳවා ගැනීම් වලින් පුරවාලීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

06. තවද ඉහත 02, 03, 04 සහ 05 ඡේදයන්ට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු නියෝග ලද සියලුම නිලධාරීන්ට **2026.03.16** දින නව සේවා ස්ථානයේ රාජකාරි

සඳහා වාර්තා කිරීමට හැකි වන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතු බවද අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් අවධාරණය කෙරේ. (ආකෘතිය - I බලන්න.)

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2026 මාර්තු මස 11 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

ආකෘතිය - I

අධිකරණයේ නම: ...........................................................................

## 2026 - වාර්ෂික ස්ථානමාරු ලැබූ නිලධාරීන්

1. අධිකරණ රෙජිස්ට්‍රාර්
2. අධිකරණ පවුල් උපදේශක
3. වැඩසටහන් සහකාර,ගිණුම් සහකාර, සංවර්ධන නිලධාරී සේවය
4. අධිකරණ භාෂණ පරිවර්තක
5. අධිකරණ ලිපිකරු
6. අධිකරණ යතුරු ලේඛක
7. අධිකරණ පොත් බැඳුම්කරු

ඉහත සඳහන් නිලධාරීන් 2026.03.16 දින සිට ස්ථාන මාරු අනුව නව සේවා ස්ථානවල සේවය කිරීමට හැකි වන පරිදි මෙම අධිකරණයෙන් මුදා හරිනු ලබන බව මෙයින් දන්වමි.

පරීක්ෂා කර බලන ලදි.

රෙජිස්ට්‍රාර්ගේ නම : ....................................................................................................

අත්සන සහ නිල මුද්‍රාව : ....................................................................................................

.............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා

නිල මුද්‍රාව

.........................................

දිනය